**ශීර්ෂය 120 - ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

**මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.**

**1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**
**2 කොටස - එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

**1 කොටස**

**ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| **ශීර්ෂය** | **දෙපාර්තමේන්තුව** |
|---|---|
| **217** | **පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව** |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,245,916,716 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.1,223,286,171 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.20,707,776 ක් හා රු.1,922,769 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 1.98 ක් හා සියයට 0.96 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| 120 | 1,044,941,116 | 1,024,233,340 | 20,707,776 | 1.98 |
| 217 | 200,975,600 | 199,052,831 | 1,922,769 | 0.96 |
| එකතුව | 1,245,916,716 | 1,223,286,171 | 22,630,545 | 1.82 |

=========== =========== ========

## 2.2 අත්තිකාරම් ගිණුම්

## 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 12001 | 22,000,000 | 14,522,650 | 800,000 | 14,281,050 | 80,000,000 | 53,494,203 |
| 21701 | 12,000,000 | 8,677,863 | 700,000 | 9,308,540 | 75,000,000 | 38,950,014 |

## 2.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

## 2.3.1 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම්වල ශේෂ එකතුව රු.7,258,036 ක් විය. විස්තර පහත දැක්වේ

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 7002/0000/00/0379/0013/000 | 2,446,820 |
| පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 7002/0000/00/0106/0013/000 | 4,811,216 |
| එකතුව | | 7,258,036 |

### 2.3.2 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.7,161,687 ක් විය. විස්තර පහත දැක්වේ

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 6000/0000/00/0015/0033/000 | 2,340,372 |
| පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0098/000 | 9,880 |
| | 6000/0000/00/0006/0079/000 | 4,811,215 |
| එකතුව | | 7,161,467 |

## 2 කොටස

**එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

### 1. ශීර්ෂය 120 - ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය

### 1.1 විගණන විෂය පථය

ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 19 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන නිරීක්ෂණය.**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (උ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසි |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| ඉන්වෙන්ට්‍රි ලේඛනය | මුදල් රෙගුලාසි 445 |
| පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛය |

**(ආ) විගණන සාක්ෂි නොවීම.**

වාර්තා කර ඇති පරිදි මුදල් රෙගුලාසි 272(2) ප්‍රකාරව කටයුතු නිම නොකළ අමාත්‍යාංශයට අදාල රු.491,808 ක් වටිනා ගෙවීම් වවුචර් 08ක් අස්ථානගතවී තිබුණි.

**(ඇ) විගණන විමසුම්වලට පිළිතුරු දීම.**

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 08 කට 2014 නොවැම්බර් 28 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.15,517,838 ක් විය.

**(ඈ) අයවැය විචලනය**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.350,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් දොලහක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17ත් සියයට 95 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඉ) අග්‍රිම ගිණුම**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 371(2) විධිවිධාන ප්‍රකාරව කාර්ය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වුවත්, අවස්ථා 26 කදී නිකුත් කර තිබුණු තත්කාර්ය අතුරු අග්‍රිමවලින් අදාල කාර්යය සඳහා යොදා ගෙන නොතිබුණු රු.2,265 සිට රු.51,260 දක්වා පරාසයක ප්‍රමාණයකින් යුත් මුදල් දින 05 ක සිට දින 84 ක් දක්වා කාල පරාසයක් අත රදවාගෙන පසුව අමාත්‍යාංශය වෙත නිරවුල් කර තිබුණි.

(ii) නිසි ඇස්තමේන්තු කිරීමකින් තොරව අවස්ථා 13 කදී තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරිම නිසා අදාළ කාර්ය නිමකළ පසු රු.8,822 ක සිට රු.47,000 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් එකතුව රු.314,066 ක අග්‍රිම ඉතිරි වී තිබුණු අතර පසුව එම අග්‍රිම මුදලින් පියවා තිබුණි.

**(ඊ) පොදු තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(I) වර්ෂ 02ක් ඉක්මවූ එකතුව රු.448,916 ක් වටිනා තැන්පතු 07 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(II) විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබුණු එකතුව රු.222,540 ක් වූ අත්තිකාරම් අදාළ කාර්යයන් සඳහා නොයොදවා තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**(උ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) නිලධාරීන් 12 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේදී අයවිය යුතු රු.6,310 ක පොලී මුදල් අයකර නොතිබුණි.

(ii) සේවයේ නියුක්ත නිලධාරීන් 02 දෙනෙකුගේ එකතුව රු.32,072ක් වූ ණය ශේෂයන් වර්ෂය තුළදී අයකර නොතිබුණි.

(iii) 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව අමාත්‍යාංශ පොත් අනුව ණය ශේෂය රු.53,494,203ක් වුවද, භාණ්ඩාගාර පොත් අනුව ශේෂය රු.53,480,611 ක් වී තිබුණි. ඒ අනුව රු.13,592ක හඳුනා නොගත් වෙනසක් විය.

(iv) 2012 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්රකාශයේ දක්වා තිබූ දෙපාර්තමේන්තු පොත් අනුව ණය ශේෂයත්, භාණ්ඩාගාර පොත් අනුව ණය ශේෂයත් අතර රු.288,981 ක වෙනසක් විය. එම වෙනස ද්විගණන දෝෂ ලෙස දක්වා ගිණුමෙන් රු.324,634ක් ඉවත් කර තිබුණි. ඒ අනුව තවදුරටත් රු.35,653 ක වෙනසක් පැවැතුණි.

## 1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.4.2 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම.

සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර 02ක් පමණක් පවත්වා තිබුණි.

**1.5 වත්කම් කළමනාකරණය**

**අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේදී පහත සදහන් අඩුපාඩු අනාවරණය විය.**

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 15 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දින වන විට අමාත්‍යාංශයට අයත් අංශ 14 ක භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර තිබූ අතර තවත් අංශ 12 කට අයත් භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2012 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ට අඩු කාලයකට අයත් අමාත්‍යාංශය විසින් බේරුම් නොකළ බැරකම් රු.78,373,678 ක් විය.

**1.6 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) | මුදල් රෙගුලාසි 94(1) | 1,815,318 | වැය විෂයයක් සඳහා සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 128(1)එ | 31,200 | පුහුණු වැඩසටහන් 4ක් සඳහා සහභාගී වූ නිලධාරින් එකසිය හැත්තෑ දෙනෙකුට (172) නවාතැන් පහසුකම් ලබාදීමට අවශ්‍ය කාමර සංඛ්‍යාවට වඩා කාමර 24 ක් වැඩිපුර ලබාගෙන ඒ සඳහා රු.31,200 ක් ගෙවා තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 880 | - | රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත ප්‍රකාරව අමාත්‍යාංශයේ ඇප තැබිය යුතු කිසිදු නිලධාරියෙකු ඇප තබා නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 1646 | - | සමාලෝචිත වර්ෂයේ වාහන 12ක ධාවන සටහන් හා මාසික සාරාංශද, වාහන 18ක මාසික සාරාංශද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

**1.7 කාර්යසාධනය**

**---------------**

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ළමා ලේකම් කාර්යාලය**

**------------------------**

අමාත්‍යාංශය විසින් මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් සහ ආහාර හා පෝෂණය පිළිබඳව ක්‍රියාත්මක කර තිබුණු වැඩසටහන් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් යටතේ "සෙනෙහස තටාක" නම් වූ දෙමවුපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් 100 ක් පැවැත්වීම සඳහා රු.500,000 ක් වෙන්කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී රු.280,000 ක් වැයකර වැඩසටහන් 57ක් පමණක් පවත්වා තිබුණි.

(ii) ආහාර හා පෝෂණය සම්බන්ධව, නිවාස ආශ්‍රිත දැනුවත් කිරීමේ වැඩසටහන් 200 ක් පැවැත්වීමට අමාත්‍යාංශය සැලැසුම් කර ඒ සඳහා රු.1,000,000 ප්‍රතිපාදන සළසා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඉන් වැඩසටහන් 157 ක් පමණක් පවත්වා තිබුණි. ඒ අනුව වැඩසටහන් 43 ක් පවත්වා නොතිබුණු අතර සළසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.220,000 ක් හෙවත් සියයට 22 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(iii) මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවරුන්ගේ ධාරිතා වර්ධනය සඳහා වැඩසටහන් 200 ක් පැවැත්වීමට සමාලෝචිත වර්ෂයෙදී රු.2,000,000 ක ප්‍රතිපාදන සළසා ගෙන තිබුණු අතර ඉන් රු.1,730,000 ක් වැයකර සමාලෝචිත වර්ෂයේදී වැඩසටහන් 173ක් පවත්වා තිබුණි.

(iv) ආදර්ශ ළමා ගම්මාන 30ක් ස්ථාපිත කිරීම සඳහා රු 4,000,000 ක ප්‍රතිපාදන සළසා ගෙන තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී රු.4,240,000ක් වැයකර ළමා ගම්මාන 15ක් ස්ථාපිත කර තිබුණි.

(v) මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවලට බෙදා හැරීම සඳහා 2012 දෙසැම්බර් 20 දින මිලදී ගත් අධ්‍යාපන උපකරණ කට්ටල 200 කින් 96 ක් පමණක් 2013 වර්ෂයේදී බෙදා හැර තිබුණි. ඉතිරි වූ තවත් කට්ටල 86 ක් 2014 දෙසැම්බර්

මාසයේදී බෙදා දී තිබුණි. ඉතිරි උපකරණ කට්ටල 18 මිලදී ගෙන වසර 2ක් ගතවී තිබියදීත් බෙදා හැරීමට කටයුතු කර නොතිබුණි .

(vi) මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා බෙදා හැරීමට 2013 දෙසැම්බර් 20 වන දින මිලදී ගත් ජල පෙරණ 700 කින් 2013 දෙසැම්බර් 31 දින වන විට කිසිවක් බෙදාහැර නොතිබුණු අතර 2014 දෙසැම්බර් වන විට ජල පෙරණ 94 ක් පමණක් බෙදාහැර තිබුණි.

**(ආ) ජාතික කාන්තා කමිටුව**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වතු ආශ්‍රිත ප්‍රජාව උදෙසා නීති උපදෙස් ලබාදීම, උපදේශනය හා දැනුවත් කිරීම පිණිස වූ ජංගම සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම සඳහා රු.200,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඒ සඳහා කිසිදු උපයෝජනයක් සිදු නොකර, දේශපාලනයේ කාන්තාවන් බලමුළු ගැන්වීමේ දෙමළ ඩිප්ලෝමා පාඨමාලාවේ, ගාස්තුවෙන් කොටසක් ගෙවා තිබුණි.

(ii) වාර්තා චිත්‍රපට මඟින් වතු ආශ්‍රිත ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා රු.100,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු16,000 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එවැනි වැඩසටහනක් පවත්වා නොතිබුණි.

(iii) ප්‍රතිපත්ති සකස් කරන්නන් වෙනුවෙන් වැඩමුළු 02ක් පැවැත්වීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.200,000ක් වෙන්කර තිබුණද එක් වැඩමුළුවක්වත් හෝ පවත්වා නොතිබුණි.

(iv) විදේශ රැකියා නියුක්ති කාර්යාංශය සහ වෙනත් ආයතන සමඟ සාකච්ඡා පැවැත්වීම සඳහා රු10,000 වෙන්කර තිබුණද වර්ෂය තුලදී කිසිදු සාකච්ඡාවක් පවත්වා නොතිබුණි.

(v) කාන්තා කමිටු නීති අංශය ශක්තිමත් කිරීම සඳහා මුල් ළමාවිය සංවර්ධන නිලධාරින්, වනිතා සංවර්ධන නිලධාරීන්, උපදේශන නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන යටතේ වැඩමුළු 05ක් පැවැත්වීම සඳහා වර්ෂය තුළදී රු.300,000 ක ප්‍රතිපාදන සළසා තිබුණද වර්ෂය තුළදී කිසිදු වැඩමුළුවක් පවත්වා නොතිබුණි.

**1.8 කළමනාකරණ දුර්වලතා**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) වනිතා ශක්ති පදනම යටතේ සුළු මූල්‍ය ශාඛා 56 ක් පවත්වා තිබූ අතර ඉන් මූල්‍ය ශාඛා 20ක් 2013 දෙසැම්බර් 31 දිනට අසාර්ථක තත්ත්වයේ පැවතුණි.

(ආ) චක්‍රීය ණය ක්‍රමය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 154 ක් යටතේ ක්‍රියාත්මක වූ අතර ණය ගෙවීම් පැහැර හැරීම් අවස්ථා 723 ක් නිරීක්ෂණය විය.

**1.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලපුම් කළයුතු ශේෂ**

ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | එකතුව |
|---|---|---|---|---|
| | | මාස 06ට වැඩි වර්ෂ 01ට අඩු | වර්ෂ 01ට වැඩි වර්ෂ 03ට අඩු | |
| | | රු. | රු. | රු. |
| (i) | උපලබ්ධි නොවූ තැන්පතු | 3,860 | - | 3,860 |
| (ii) | හඳුනා නොගත් හර | 7,908 | 60,218 | 68,126 |
| (iii) | හඳුනා නොගත් බැර | 277,038 | 3,565 | 280,603 |

**1.10 මානව සම්පත් කළමනාකරණය**

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 26 | 23 | 03 | - |
| (ii) | තෘතීයික මට්ටම | 17 | 12 | 05 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,424 | 1,160 | 264 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 68 | 68 | - | - |
| (v) | වෙනත්(අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත්) | - | 03 | - | 03 |
| | **එකතුව** | **1,535** | **1,266** | **272** | **03** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ද්විතික මට්ටමේ තනතුරු 264 ක්ද, තෘතියික මට්ටමේ තනතුරු 05 ක්ද හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක්ද පුරප්පාඩු වී තිබුණු අතර එම තනතුරු පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

2. ශීර්ෂය 217 - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

2.1 **විගණන විෂය පථය**

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 25 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2.3 විගණන නිරීක්ෂණය.**

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---

දෙපාර්තමේන්තුව විසින් සෙවන සරණ කැපකරු මාපිය ක්‍රමයට අදාළ පොත්පත් හා ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

**(ආ) අග්‍රිම ගිණුම**

---

මුදල් රෙගුලාසි 371 විධිවිධානයට පටහැනිව අවස්ථා දෙකකදී නිලධාරීන් දෙදෙනෙකු වෙත විධිමත් අනුමැතියකින් තොරව රු.20,000 ක සීමාව ඉක්මවා එකතුව රු.120,000 ක තත් කාර්ය අතුරු අග්‍රිමයන් නිකුත් කර තිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

---

නැණ දිරිය හා සෙවන සරණ කැපකරු මාපිය ක්‍රමය යටතේ ලබා දී තිබුණු රු.4,811,216 ක් අදාල කාර්ය ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**2.4 බේරුම් නොකළ බැරකම්**

-----------------------------
දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වඩා අඩු කාලයක සිට පැවැත එන බේරුම් නොකළ බැරකම්වල වටිනාකම රු.1,130,817 ක් විය.

## 2.5 අනුකූල නොවීම්

**නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානයන්ට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (අ) මුදල් රෙගුලාසි 165(1) | 6,481,820 | සෙවන සරණ මාපිය ක්‍රමය යටතේ ලැබුණු මුදල් ලේඛනයක සටහන් කර නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 168(1) | 2,345,872 | දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණු රු.2,231,873 ක ලැබීම් වෙනුවෙන් මාසයක පමණ කාලයක් ප්‍රමාද කර කුවිතාන්සි නිකුත් කර තිබුණු අතර, තවත් රු.114,000 ක ලැබීම් වෙනුවෙන් කුවිතාන්සි නිකුත් කර නොතිබුණි. |
| (ඇ) මුදල් රෙගුලාසි 177(1) | 646,000 | දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණු චෙක්පත් වහාම බැංකු ගත නොකර මාසයකට වැඩි කාලයක් අත රඳවා ගෙන බැංකුගත කර තිබුණි. |

## 2.6 කාර්යසාධනය

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්

සෙවන සරණ කැපකරු මාපිය ක්‍රමය හා නැණ දිරිය වැඩසටහන වෙත ලැබී තිබුණු පරිත්‍යාගවලින් රු.4,811,216 ක් ප්‍රතිලාභී දරුවන් වෙත නොගෙවා තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු මුදලින් සියයට 73 ක ප්‍රමාණයක් පරිත්‍යාගශීලීන් විසින් ලබා දී අතර, එම මුදල් අදාළ ප්‍රතිලාභී දරුවන් වෙත නොගෙවීම නිසා ඔවුනට ලැබිය යුතුව තිබුණු පොලිය අහිමි වී තිබුණි.

**(ආ) සැලැසුම් කිරීම**

විගණනයට ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යසාධන වාර්තාවේ සඳහන් අත්කරගෙන තිබුණු ප්‍රගතිය සමඟ සැසඳීමේදී ක්‍රියාකාරී සැලැස්මේ සඳහන්ව තිබුණු පහත සඳහන් අපේක්ෂිත ඉලක්ක ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(i) වීදි දරුවන් සඳහා සුභසාධන වැඩසටහන් 500 ක් පැවැත්වීමට රු.870,000 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, රු.850,000 ක් වැය කර වැඩසටහන් 275 ක් පවත්වා තිබු අතර වැඩසටහන් 225 ක් පවත්වා නොතිබුණි.

(ii) ආයතනගත ළමුන් 200 ක් නේවාසිකව පුහුණු කිරිම අපේක්ෂා කළද, ළමුන් 20 ක් පමණක් පුහුණු කර තිබුණි. සම්පූර්ණ පුහුණුව සඳහා රු.150,000 ක් වැය කිරීමට අපේක්ෂා කර තිබුණත්, මේ සඳහා රු.1,500 ක් වැය කර තිබුණි.

(iii) ආයතනගත ළමුන් 200 කට හැකියා වර්ධනය සඳහා පුහුණුවක් ලබා දීමට රු.200,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.122,000 ක් වැය කර ළමුන් 54 දෙනෙකුට පමණක් පුහුණුව ලබා දී තිබුණි.

(iv) නිලධාරීන්ගේ හැකියා වර්ධන පුහුණුව සඳහා නිලධාරීන් 100 ක් පුහුණු කිරීම සඳහා රු.150,000 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, ඉන් රු.8,000 ක් වැය කර තිබුණත්, අපේක්ෂිත පුහුණුවීම් ලබාදී නොතිබුණි.

**(ඇ) වාර්තා නොසැසඳීම**

විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු 2013 දෙසැම්බර් 31 දිනට වූ කාර්යසාධන වාර්තාව, වාර්ෂික වාර්තාව හා විගණනය වෙත ලබා දුන් ලිපිගොණු අතර පහත සඳහන් තොරතුරු වෙනස්කම් නිරික්ෂණය විය.

| | 2013 කාර්යසාධන වාර්තාව | 2013 වාර්ෂික වාර්තාව | 2013 වර්ෂයේ ලිපිගොණු අනුව |
|---|---|---|---|
| | ළමුන් සංඛ්‍යාව | ළමුන් සංඛ්‍යාව | ළමුන් සංඛ්‍යාව |
| සෙවන සරණ ආධාර | 117 | 108 | 95 |
| වීදි දරුවන් සඳහා සුභසාධනය | 275 | - | 195 |

**2.7 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව 2013 දෙසැම්බර් 31 දිනට නිකුත් කර තිබුණත්, බැංකුව වෙ ත ඉදිරිපත් වී නොතිබුණු මාස 06 ක කාලයක් ඉක්මවා තිබුණු එකතුව රු.2,337 ක් වටිනා චෙක්පත් 2 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.8 කළමනාකරණ දුර්වලතා**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ලෝක ළමා දින කොඩි අලෙවිය, ළමා හිමිකම් නිලධාරීන් මගින් සිදු කිරීම සඳහා දෙපාර්තමේන්තුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල 22 ක් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 297 ක් වෙත රු.54,230 ක් වටිනා කොඩි 740,850 ක් නිකුත් කර තිබුණි. 2014 මැයි 10 දින වන විටත් කොඩි 519,300 ක් නිකුත් කර තිබුණු දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 221 කින් එම කොඩිවල වටිනාකම ලැබී නොතිබුණි. එම කාර්යාලවල යැවූ කොඩිවලින් අලෙවි වී ඇති ප්‍රමාණය හා ඉතිරිය පිළිබඳ විස්තර අදාළ නිලධාරීන්ගෙන් ලබා ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) ළමා නිවාසවල ළමුන්ගේ තත්ත්වය සමීක්ෂණය කිරීම සඳහා යුනිසෙෆ් ව්‍යාපෘතිය යටතේ ලද රු.2,589,169 ක් ජාතික සමාජ හා සංවර්ධන ආයතනය වෙත ගෙවා තිබුණු අතර, 2014 නොවැම්බර් මාසය වන විටත් සමීක්ෂණ වාර්තාව ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

**2.9 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 04 | 03 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 240 | 239 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 212 | 169 | 43 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 16 | 14 | 02 |
| | **එකතුව** | **472** | **425** | **47** |

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 47 පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.